(නවවැනි පාර්ලිමේන්තුව - පස්වැනි සභාවාරය)

අංක 7.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2024 මාර්තු 05 අඟහරුවාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1/2024

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අකුරණ ප්‍රදේශවාසීන් විසින් කැළි කසල, අබලි ගොඩනැඟිලි ද්‍රව්‍ය, හිස් ටින්, ප්ලාස්ටික් බෝතල්, මළ අපද්‍රව්‍ය අකුරණ නගරය හරහා ගලා යන පිඟා ඔයට දැමීම නිරතුරුවම සිදු කරනු ලබන බවත්;

(ii) එසේම එම ඔයේ ඉවුරු දෙපස අනවසරයෙන් ගොඩනැඟිලි ඉදිකරනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)හි සඳහන් හේතු නිසා වර්ෂා කාලයේදී ගංවතුර ඇති වීමේ අවදානම හා මහවැලි ගඟට දූෂිත අපද්‍රව්‍ය එකතු වීම සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා වාර්තා ලබා ගෙන තිබේද;

(ii) පිඟා ඔය දෙපස ඉදිකර ඇති අනවසර ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) එයට කැළි කසල හා අපද්‍රව්‍ය බැහැර කරන පුද්ගලයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා සහ එම ඔය දෙපස ඉදිකර ඇති අනවසර ගොඩනැගිලි ඉවත් කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් තිබේද;

(iv) මේ වනවිට පිඟා ඔයේ ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා පියවර ගෙන තිබේද;

(v) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

41/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1948.02.04 දිනෙන් පසුව මරණ දඬුවම නියම කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ එල්ලා මරණයට පත් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එල්ලා මරණයට පත් කරන පුද්ගලයින්ගේ මරණ සහතික ඥාතීන් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හිටපු අග්‍රාමාත්‍ය ගරු එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා ඝාතනය කිරීම සම්බන්ධයෙන් වැරදිකරු වූ තල්දූවේ සෝමාරාම හිමියන්ගේ මරණ සහතිකය මෙතෙක් නිකුත් කර නොමැති බවත්;

(ii) 1962.07.06 දින තල්දූවේ සෝමරාම හිමි එල්ලා මැරූ බවට සඳහන් වුවද එදිනට එම නමින් මරණයක් ලියාපදිංචි වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) තල්දූවේ සෝමරාම හිමියන්ගේ මරණ සහතිකය නිකුත් නොකිරීම පිළිබඳ පරීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එහි නිගමනය කවරේද;

(iii) නොඑසේ නම්, පරීක්ෂණයක් සිදු කරන්නේද;

(iv) මරණ දඬුවම ක්‍රියාත්මක කිරීමෙන් පසු අදාළ මරණ සහතික නිකුත් නොකළ තවත් පුද්ගලයන් සිටීද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

309/2024

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රටේ සුභසිද්ධිය වෙනුවෙන් ජාත්‍යන්තර සම්බන්ධතා සහ අධ්‍යාපන වැඩසටහන් සඳහා 2020.08.20 සිට අද දක්වා නවවැනි පාර්ලිමේන්තුවේ කථානායකවරයා සහභාගි වූ නිල විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් විදේශ සංචාරය සඳහා සහභාගි වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් හා නිලධාරින්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත විදේශ සංචාරවලින් අත්පත් කර ගනු ලැබූ ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

354/2024

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2022 දෙසැම්බර් 31 දිනට —

(i) සිය අරමුදල් ආයෝජනය කිරීමෙන් සේවක අර්ථසාධක අරමුදල උපයා ඇති මුළු මුදල;

(ii) අරමුදලේ මුළු තැන්පතුවල වටිනාකම;

(iii) අරමුදල් ආයෝජනය කිරීමෙන් උපයන ලද මුළු මුදල, අරමුදලේ මුළු තැන්පතුවල වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2022 දෙසැම්බර් 31 දිනට —

(i) සේවක අර්ථසාධක අරමුදලේ දායකයන් සංඛ්‍යාව;

(ii) සක්‍රීය දායකයන් සංඛ්‍යාව;

(iii) ඉහත සක්‍රීය දායකයන්ගේ ගිණුම් ශේෂයන්හි මුළු වටිනාකම;

(iv) අරමුදල් ආයෝජනය කිරීමෙන් උපයන ලද මුළු මුදල, සක්‍රීය දායකයන්ගේ ගිණුම් ශේෂයන්හි මුළු වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

361/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2023 ඔක්තෝබර් 01 දින වන විට —

(i) රජයේ පාසල්වල සේවය කරනු ලබන ගුරුවරුන්, ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් සහ අධ්‍යාපන පරිපාලන සේවයේ විදුහල්පතිවරුන් සංඛ්‍යාව;

(ii) ගණිතය, විද්‍යාව, තාක්ෂණය, ඉංග්‍රීසි, සෞන්දර්ය, ක්‍රීඩා සහ ප්‍රාථමික අධ්‍යාපනය යන එක් එක් විෂය සඳහා සිටිය යුතු ගුරුවරුන් සංඛ්‍යාව සහ මේ වනවිට සේවය කරනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව අධ්‍යාපන කලාපය අනුව;

(iii) විදුහල්පති තනතුරේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අධ්‍යාපන කලාපය අනුව;

(iv) වැඩබලන විදුහල්පතිවරුන් ලෙස සේවය කරනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව අධ්‍යාපන කලාපය අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වැඩිම ගුරු හිඟය හා අතිරික්තය පවතින සහ වැඩිම විදුහල්පති හිඟය හා අතිරික්තය පවතින අධ්‍යාපන කොට්ඨාස විස්සේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

365/2024

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය නගා සිටුවීම සඳහා ස්ථාපිත කර ඇති රාජ්‍ය ආයතනවල නම් කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ වාර්ෂික පොල් නිෂ්පාදනයෙන් ගෘහස්ථ පරිභෝජනය, පොල් තෙල් නිෂ්පාදනය හා අපනයනය ආශ්‍රිත කර්මාන්ත යන එක් එක් අංශය සඳහා භාවිතා කරනු ලබන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 2001 සිට 2020 දක්වා එක් එක් වර්ෂයේ ශ්‍රී ලංකාවේ පොල් ඵලදාව එක් එක් වර්ෂයට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පොල් ඵලදාව ඉහළ නැංවීම සඳහා ඉහත කාලය තුළදී සිදු කරන ලද වැඩසටහන් කවරේද;

(v) එම වැඩසටහන් සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

373/2024

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022 වර්ෂය තුළ රිය අනතුරුවලට ලක් වී ඇති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම අනතුරු හේතුවෙන් මරණයට පත් වූ හා තුවාල ලැබූ මගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත අනතුරු සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් විමර්ශන සිදු කර තිබේද;

(iv) එසේ නම්, එම විමර්ශනවල නිගමන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2022 වර්ෂය තුළ රිය අනතුරුවලට ලක් වී ඇති පුද්ගලික බස්රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම අනතුරු හේතුවෙන් මරණයට පත් වූ හා තුවාල ලැබූ මගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අනතුරු අවම කර ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

377/2024

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉන්ධන බෙදාහැරීම සඳහා ශ්‍රී ලංකාවේ ඉදිකර ඇති ඉන්ධන බෙදාහැරීමේ ප්‍රධාන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් මධ්‍යස්ථානයේ ගබඩා ධාරිතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් මධ්‍යස්ථානයේ ගබඩා ධාරිතාවය අවසන්වරට වැඩි කරන ලද දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ වර්තමාන ඉන්ධන ඉල්ලුමට සාපේක්ෂව ඉහත සඳහන් මධ්‍යස්ථානවල ගබඩා ධාරිතාව පහළ මට්ටමක පවතින බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒවයේ ගබඩා ධාරිතාවය වැඩි කිරීමට කටයුතු කරන්නේද;

(iii) ඒ සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) බවුසර් මඟින් ඉන්ධන ප්‍රවාහනය කිරීමට සාපේක්ෂව දුම්රිය ගැල් මඟින් ඉන්ධන ප්‍රවාහනය කිරීම ලාභදායක සහ ගැටලු අවම ක්‍රමයක් බව පිළිගන්නේද;

(v) එසේ නම්, ඉන්ධන ප්‍රවාහනය සඳහා වැඩි වශයෙන් දුම්රිය භාවිතා කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

464/2024

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— වනජීවී හා වන සංරක්ෂණ කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල පවතින කළුගල් කඩා ඉවත් කිරීමට අවසර ලබා දීමේ ගාස්තු ලෙස, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කළුගල් කඩා ඉවත් කිරීමේ ගාස්තුව 50%කින් අඩු කිරීමට තීරණය කරන ලද දිනය කවරේද;

(iii) ගාස්තු අඩු කිරීමට බලපාන ලද හේතු සාධක කවරේද;

(iv) ඒ හේතුවෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අහිමි වූ මුදල ඉහත (ii)හි සඳහන් තීරණය ක්‍රියාත්මක කරන ලද දිනයේ සිට අද දක්වා එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත (ii)හි සඳහන් තීරණය සාධාරණීකරණය කිරීමට ඇති හේතු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1220/2024

ගරු කුමාරසිරි රත්නායක මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමෘද්ධිලාභීන්ට සහ අඩු ආදායම්ලාභීන්ට බෙදා දීම සඳහා 2022 වර්ෂයේ මහ කන්නයේදී මොනරාගල දිස්ත්‍රික්කයේ, රජය විසින් මිලදී ගන්නා ලද වී ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා මොනරාගල දිස්ත්‍රික්කයට ලබා දෙන ලද මුදල කොපමණද;

(iii) එම මුදලින් වී මිලදී ගැනීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මිලදී ගන්නා ලද ඉහත වී සහල් බවට පත් කිරීමේදී, වී මෝල් හිමියන් විසින් එම කාර්යය සාර්ථකව ඉටුකිරීමට සමත් වී තිබේද;

(ii) එම සහල් ප්‍රතිලාභීන් වෙත බෙදා දීමේදී අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එම කාර්යය නිවැරදිව ඉටුකර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන),— (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

2.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන),— 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 5.30 දක්වා විය යුතු ය. අ.භා. 4.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

4.

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"බුද්ධශ්‍රාවක සුරක්ෂිතා මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2024 පෙබරවාරි 20) [1].

*2.

භාර ලදුපත් (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2024 පෙබරවාරි 20) [1].

*3.

උකස් (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2024 පෙබරවාරි 20) [1].

*4.

කල්බදු මූල්‍යකරණ (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2024 පෙබරවාරි 20) [1].

*5.

දේශීය භාර ලදුපත් (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2024 පෙබරවාරි 20) [1].

*6.

සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2024 පෙබරවාරි 20) [1].

*7.

ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2024 පෙබරවාරි 20) [1].

*8.

ධීවර අමාත්‍යතුමා,— සීමාසහිත සීනෝර් පදනමේ වාර්ෂික වාර්තාව (2018),— 2007 අංක 07 දරන සමාගම් පනතේ 131 වගන්තිය යටතේ 2023.01.17 දින ඉදිරිපත් කරන ලද 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සීමාසහිත සීනෝර් පදනමේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.03.22 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.03.24 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*9.

ධීවර අමාත්‍යතුමා,— ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2019),— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(1) වගන්තිය යටතේ 2022.11.30 දින ඉදිරිපත් කරන ලද 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.03.22 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.03.24 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*10.

ධීවර අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව (2020),— 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරි පනත යටතේ 2023.03.24 දින ඉදිරිපත් කරන ලද 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.07.06 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.08.09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*11.

සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

සාප්පු හා කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

සත්ව සුබසාධන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

බෙදුම් නඩු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග (අංක 1),— 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 52(5) වගන්තිය සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විමසා, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 ඔක්තෝබර් 25 දිනැති අංක 2355/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.12.02 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 1),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 මාර්තු 24 දිනැති අංක 2324/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.04.25 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 2),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 සැප්තැම්බර් 09 දිනැති අංක 2296/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.10.06 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග (අංක 2),— 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව සහ අදාළ නියාමන අධිකාරීන් විමසා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2023 නොවැම්බර් 17 දිනැති අංක 2358/70 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.02.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත යටතේ නියෝගය,— 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද සම්බන්ධයෙන් වැඩබලන මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 සැප්තැම්බර් 21 දිනැති අංක 2350/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.02.22 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*24.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— එකතු කළ අගය මත බදු පනත යටතේ නියමය,— 2005 අංක 6 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ එකතු කළ අගය මත බද්ද සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 දෙසැම්බර් 19 දිනැති අංක 2363/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.02.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— පුරාවස්තු ආඥාපනත යටතේ නියෝග,— (188 වන අධිකාරය වූ) 1940 අංක 9 දරන පුරාවස්තු ආඥාපනතේ 46 වගන්තිය සමඟ කියවිය යුතු 47(1) වගන්තිය යටතේ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් 2023 මැයි 25 දින සාදනු ලදුව, 2023.07.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— නීති අධ්‍යාපන සභා ආඥාපනත යටතේ රීති,— (276 අධිකාරය වූ) නීති අධ්‍යාපන සභා ආඥාපනතේ 7 වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සංස්ථාගත නීති අධ්‍යාපන සභාව විසින් සාදන ලදුව, 2023 මැයි 15 දිනැති අංක 2332/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.07.18 දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*27.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— විෂවර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග ආඥාපනත යටතේ නියෝග,— (218 අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග ආඥාපනතේ 77අ(6) වගන්තිය සමඟ කියවිය යුතු 80 වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 නොවැම්බර් 27 දිනැති අංක 2360/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.02.08 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*28.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 1),— (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ VII කොටස සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 ජූනි 28 දිනැති අංක 2338/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.01.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*29.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 2),— (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 21, 22, 23, 24 සහ 24අ වගන්ති සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 ඔක්තෝබර් 05 දිනැති අංක 2352/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.01.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*30.

සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා,— සංචාරක කටයුතු පනත යටතේ නියමය (අංක 1),— 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 26(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්දේශය සහිතව, සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 සැප්තැම්බර් 07 දිනැති අංක 2348/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.01.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*31.

සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා,— සංචාරක කටයුතු පනත යටතේ නියමය (අංක 2),— 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 26(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්දේශය මත සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ඔක්තෝබර් 06 දිනැති අංක 2352/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.02.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*32.

සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා,— සංචාරක කටයුතු පනත යටතේ නියමය (අංක 3),— 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 26(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්දේශය මත සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ඔක්තෝබර් 06 දිනැති අංක 2352/48 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.02.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*33.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— රාජ්‍යතාන්ත්‍රික වරප්‍රසාද පනත යටතේ නියෝගය,— 1996 අංක 9 දරන රාජ්‍යතාන්ත්‍රික වරප්‍රසාද පනතේ 4 සහ 5 වගන්ති යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICRAF) අතර පවතින සත්කාරක රාජ්‍ය ගිවිසුමේ IV, V, VI, IX, X, XI, XII, XIII, XIV, XV සහ XVI වගන්තිවල නියමයන් බලාත්මක කිරීම සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2023 සැප්තැම්බර් 08 දිනැති අංක 2348/48 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.02.20 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

34.

ජාත්‍යන්තර සිංහ සමාජ දිස්ත්‍රික්ක 306 ඒ - ජාතික සංවර්ධන පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

35.

දුම්කොළ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

36.

රොෂාන් රණසිංහ ජනසහන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

37.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

38.
සාමය, අධ්‍යාපනය, බලගැන්වීම සහ සංවර්ධනය උදෙසා වූ ක්‍රීඩා ආයතනය (SPEED) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

39.
හදිසි මහජන සෞඛ්‍ය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

40.
ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

41.
විවාහ (සාමාන්‍ය) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

42.
මුස්ලිම් විවාහ හා දික්කසාද (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

43.
ශ්‍රී ලංකා ප්ලාස්ටික් සහ රබර් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

44.
විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

45.
විවාහවීමේ අවම වයස පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

46.
වෘත්තීයවේදීන්ගේ ප්‍රජා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

47.
සත්‍ය ශ්‍රී ගණපති භක්ති ජන සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

48.
අරුන්දික ප්‍රනාන්දු සහන සේවා සහ ගොඩ්ෆ්‍රි ප්‍රනාන්දු අනුස්මරණ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

49.
ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණඥයින්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**[1]**
''පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය'' යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---